# 5 සන්මු නගරයේ පදිංචිවන විට ලිපිනය වෙනස් වන විට කළයුතු දේ

සන්මු නගරයේ පදිංචි වන අවස්ථාවේදී සහ පදිංචි ස්ථාන වෙනස් කිරීමේදී කරුණාකර නගර සභා කාර්යාලයට පැමිණෙන්න.
නගරසභාවේ ＜ මහජන සම්භන්ධතා අංශය ( *Shiminka* ) ＞ සහ නගර සභාවේ සහ නගරසභා ශාඛා කාර්යාල ( *Shuchchōjyo* ) වලදී ලිපිනය වෙනස්වීම් ආදි කාර්යයන් සිදුකරගත හැක.




## (1) <u>පදිංචිය ඉල්ලුම්කිරීම ( *Tennyū todoke* )</u> ( සන්මු නගරයේ පදිංචි වීම )

| | | |
|---|---|---|
| <u>ඉල්ලුම් පත් භාරදෙන</u> විට | ජපානයෙන් පිට ( පිටරටක ) සිට සන්මු නගරයේ පදිංචියට පැමිණි විට | වෙනත් නගර වල සිට සන්මු නගරයේ පදිංචියට පැමිණි විට |
| <u>ඉල්ලුම් පත් භාරදීම</u> සිදුකරන කාල සීමාව | පදිංචි වීමට පෙර දැනුම් දීමේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළයුතුවේ. ( සන්මු නගරයේ පදිංචි වූ දිනයේ සිට ) දවස් 14 ක් ගතවීමට පෙර පදිංචිය පිළිබඳව ඉල්ලුම්පත් නගරසභාවට භාරදියයුතු වේ. | |
| රැගෙන ආයුතු ලියකියවිලි ( සියල්ලම ) | ① ගුවන් ගමන් බලපත්‍රය ( පවුලේ සියලු දෙනාගේ ගමන් බලපත්‍රය )<br>※ජපානයට ඇතුළුවූ විටආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන නිලමුද්‍රාව පැහැදිළිව පෙන්විය යුතුයි. නිලමුද්‍රාව නැති අවස්ථාවකදී ජපානයට පැමිණි දිනය සඳහන් කිරීමට හැකි ලිපි රැගෙනආ යුතුය.<br>( ගුවන් ටිකට්පතේ වායරූපයක් )<br>② ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත <u>( *Zairyū Kādo* )</u> හෝ ස්ථිර පදිංචිය සනාථ කරන හැඳුනුම්පත් ( *Tokubetsu Eijūshashō* ) ( පවුලේ සියලු දෙනාගේම )<br>පවුලේ සාමාජිකයින් සිටින විට <u>විවාහ සහතිකය ( *Kon'in Shōmeisho* )</u> සහ <u>උප්පැන්න සහතිකවල ( *Shusshō Shōmeisho* )</u> වල පිටපත | ① මේ දක්වා පදිංචි වී සිටි නගරයෙන් <u>පදිංචිය ඉවත් කිරීමේ පත්‍රිකාව ( *Tenshutsu Shōmeisho* )</u><br>② ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත <u>( *Zairyū Kādo* )</u><br>ස්ථිර පදිංචිය සනාථ කරන හැඳුනුම්පත් ( *Tokubetsu Eijūshashō* ) පවුලේ සියළුදෙනාගේම<br>③ <u>පෞද්ගලික අංකය සහිත කාඩ්පත ( *Kojin Bangō Kādo* ) ＜ *Mainanbā Kādo* ＞</u><br>④ පවුලේ සාමාජිකයින් සිටින විට <u>විවාහ සහතිකය ( *Kon'in Shōmeisho* )</u> සහ <u>උප්පැන්න සහතිකවල ( *Shusshō Shōmeisho* )</u> වල මුල් පිටපත්. |
| රැගෙන ආයුතු ලියකියවිලි ( සියල්ලම ) | ※සහතික වල පිටපත් වායරූප මගින් ඉල්ලුම් කිරීමට නොහැකිබවකරුණාවෙන් සලකන්න.<br>※ජපන් භාෂාවට පරිවර්තනය කරන ලද ලියකියවිලි ද කරුණාකර රැගෙන එන්න | ※සහතික වල පිටපත් වායරූප මගින් ඉල්ලුම් කිරීමට නොහැකිබව කරුණාවෙන් සලකන්න.<br>※ජපන් භාෂාවට පරිවර්තනය කරන ලද ලියකියවිලි ද කරුණාකර රැගෙන එන්න. |
| ඉල්ලුම් කළහැකි පුද්ගලයින් | ඔබ හෝ ඔබ සමග පදිංචි වී සිටින පවුලේ අයෙකු<br>( ඊට අමතරව වෙනත් පුද්ගලයෙකු නගරසභාවට පැමිණෙන්නේ නම් <u>පැවරුම් ලිපිය ( *Ininjō* )</u> රැගෙන එන්න. ) | |

## (2) <u>පදිංචිය ඉවත් කිරීම ( *Tenshutsutodoke* )</u> ( සන්මු නගරයෙන් පිටවීම )

| | |
|---|---|
| <u>ඉල්ලුම් පත් භාරදෙන</u> විට | සන්මු නගරයේ ජීවත් වූවන් වෙනත් පිට නගරයක පදිංචියට යනවිට |
| ඉල්ලුම් පත් භාරදීම සිදුකරන කාල සීමාව | පදිංචිය අත්හැරයෑමට පෙර නගරයෙන් පදිංචිය වෙනස් වනබව දැනුම් දිය යුතුයි.<br>තවද, පදිංචිය වෙනස් කර දවස් 14 ක් ගතවීමට පෙර ඒ පිළිබදව දැනුම් දීමේ ඉල්ලුම්පත නගර සභාවට භාර දිය යුතුයි. |
| රැගෙන ආයුතු ලියකියවිලි | ① ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැදුනුම්පත <u>( *Zairyū Kādo* )</u> හෝ ස්ථිර පදිංචිය සනාථ කරන හැදුනුම්පත් ( *Tokubetsu Eijūshasho* ) ( පවුලේ සියළුදෙනාගේම )<br>② සීල්එක ( *Inkan* ) ලියාපදිංචි කළ සහතිකය ( සහතික පත්‍රය ලබා ඇති පුද්ගලයෝ )<br>③ <u>ජාතික සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ( *Kokumin Kenkōhokenshō* )</u><br>(සන්මු නගරසභාවේ සෞඛ්‍ය රක්ෂණට ඇතුලත් වී ඇති අය ) |
| ඉල්ලුම් කළහැකි පුද්ගලයින් | ඔබ හෝ ඔබ සමග පදිංචි වී සිටින පවුලේ අයෙකු<br>( ඊට අමතරව වෙනත් පුද්ගලයෙකු නගරසභාවට පැමිණෙන්නේ නම් <u>පැවරුම් ලිපිය ( *Ininjō* )</u> රැගෙන එන්න. ) |



## (3) <u>පදිංචි ස්ථානය මාරුකිරීම ( *Tenkyotodoke* )</u> ( <u>සන්මු නගරයතුළ පදිංචිය වෙනස් කිරීම)</u>

| | |
|---|---|
| <u>ඉල්ලුම් පත් භාරදෙන</u> විට | සන්මු නගරය ඇතුළත පදිංචිය වෙනස් කිරීම |
| නගරසභාවට ඉල්ලුම්පත් භාර දීමේ කාලසීමාව | පදිංචිය වෙනස් කර දවස් 14 ක් ගතවීමට පෙර ඒ පිළිබදව නගරසභාවටදැනුම් දී ලියාපදිංචි කළයුතුයි |
| රැගෙන ආයුතු ලියකියවිලි | ① ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැදුනුම්පත <u>( *Zairyū Kādo* )</u> හෝ ස්ථිර පදිංචිය සනාථ කරන හැදුනුම්පත් ( *Tokubetsu Eijūshasho* ) පත ( පවුලේ සියළුදෙනාගේම )<br>② <u>ජාතික සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ( *Kokumin Kenkōhokenshō* )</u><br>( නගරසභාවේ සෞඛ්‍ය රක්ෂණට ඇතුලත් වී ඇති අය ) |
| ඉල්ලුම් කළහැකි පුද්ගලයින් | ඔබ හෝ ඔබ සමග පදිංචි වී සිටින පවුලේ අයෙකු<br>( ඊට අමතරව වෙනත් පුද්ගලයෙකු නගරසභාවට පැමිණෙන්නේ නම් <u>පැවරුම් ලිපිය ( *Ininjō* )</u> රැගෙන එන්න. ) |



◎ 14 වෙනි පිටුවේ සිට 15 වෙනි පිටුව දක්වා අමාරු වචන ◎

※පදිංචිය ඉල්ලුම් කිරීම ( *Tennyūtodoke* ) : සන්මු නගරයේ පදිංචිය ඉල්ලා සිටීමේදී සන්මු නගරසභාවට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළයුතුවේ.

※ඉල්ලුම් පත් භාර දීම ( *Todokede* ) : අවශ්‍ය ලියකියවිලි ( *Shorui* )<ඉල්ලුම් පත්‍රය ( *Kami* )>නගර සභාවට ඉදිරිපත් කිරීම නගර සභාවට පැමිණ ඉල්ලුම් පත්‍රය පුරවන්න.

※විවාහ සහතිකය ( *Kōn'in Shōmeisho* ) : දෙදෙනා විවාහ වී ඇති බව සඳහන් කර ඇති ලියකියවිලි

※උප්පැන්න සහතිකය ( *Shusshō Shōmeisho* ) : දරුවෙක් ඉපදුන විට, රෝහලෙන් ලැබුණු ලියවිල්ල

※පදිංචිය ඉවත් කිරීමේ පත්‍රිකාව ( *Tenshutsu Shōmeisho* ) : මේ දක්වා පදිංචිවසිටි නගරයේ නගරසභාවෙන් ඔබ ඒනගරයෙන් ඉවත්වෙන බවටලබාදෙන ලියවිල්ල

※පෞද්ගලික අංකය සහිත කාඩ්පත ( *Kojin Bangō Kādo* ) < *Mainanbā Kādo* > : තමා ට පමණක් අයත් අංක12කින් යුත් ඉලක්කම් ලියා ඇති ලියවිල්ල

※පැවරුම් ලිපිය ( *Ininjō* ) : ඔබ හෝ ඔබ සමග පදිංචි වී සිටින පවුලේ අයෙකු ඊට අමතරව වෙනත් පුද්ගලයෙකු නගරසභාවට පැමිණෙන්නේ නම් පැවරුම් ලිපිය ( *Ininjō* ) රැගෙන එන්න.

※පදිංචි ස්ථානය මාරුකිරීම ( *Tenkyotodoke* ) : සන්මු නගර ඇතුළත පදිංචිය මාරුකිරීමේදී ඒ පිළිබඳව නගරසභාවට දැනුම් දීම

※පදිංචිය ඉවත් කිරීම ( *Tenshutsutodoke* ) : සන්මු නගරයෙන් ඉවත් වී වෙනත් නගරයක පදිංචියට යනවිට නගර සභාවට ඒ බව දැනුම් දීම.

※ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත ( *Zairyū Kādo* ) : ජපානයට පැමිණිය විට ජපන් ආගමන විගමන කාර්යාංශයේදී ලබාගත හැකි අයිඩී පත මෙම නමින් හැඳින්වේ. ජපානයේ මාස 6කට වඩා කාලයක් පදිංචි වී සිටින විට මෙම හැඳුනුම්පත ලබාගතහැක.බොහෝ වැදගත් දෙයකි. දිනපතාම මෙය ළගතබා ගතයුතු වේ.
( ආගමන විගමන කාර්යාංශය ගුවන් තොටුපළ ඇතුළේ පිහිටුවා ඇත. )

※ජාතික සෞඛ්‍ය රක්‍ෂණ කාඩ්පත ( *Kokumin Kenkōhokenshō* ) : 24 වෙනි පිටුවේ සිට 27 පිටුව දක්වා කරුණාකර කියවා බලන්න.

| ලියකියවිලි ඉදිරිපත් කරන ස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| මහජන සම්බන්ධතා අංශය<br>( *Shiminka* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය<br>( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක② | 0475-80-1141 |
| සන්බු උප නගරසභාව<br>( *Sanbu Shutchōjo* ) | 1884-1 හනියා, සන්මු නගරය<br>( 1884-1,Haniya,Sammu-shi ) | 0475-89-3600 |
| හසුණුම උප නගරසභාව<br>( *Hasunuma Shutchōjo* ) | 233 බන්චි,හසුණුමා හා, සන්මු නගරය<br>( 233,Hasunuma ha,Sammu-shi ) | 0475-86-3111 |
| මත්සුඔ උප නගරසභාව<br>( *Matsuo Shutchōjo* ) | 3012 බන්චි,ගොතන්දා,මත්සුඔ මචි,සන්මුනගරය<br>( 3012,Matsuomachi gotanda,Sammu-shi ) | 0479-80-7117 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා උදේ 8.30සිට හවස 5.00 දක්වා

※ඉල්ලුම් කිරීමේදී මෙහි සිදුකෙරෙන කාර්යයන් සඳහා කාලය ගතවේ. එමනිසා කරුණාකර වේලාසනින් නගරසභාවට පැමිණෙන්න.

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.